# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2014 අංක 4 දරන පිලිප් ගුණවර්ධන ගුණානුස්මරණ සංගමය (සංස්ථාගත කිරීමේ) පනත

---

**[සහතිකය සටහන් කළේ 2014 මාර්තු මස 04 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2014 මාර්තු මස 07 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ :** රු. 3.00 යි. තැපැල් ගාස්තුව **:** රු. 5.00 යි.

## 2014 අංක 4 දරන පිලිප් ගුණවර්ධන ගුණානුස්මරණ සංගමය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2014 මාර්තු මස 04 වන දින]

එල්.ඩී.—ඕ. (අයි. එන්. සී.) 11/2012.

### පිලිප් ගුණවර්ධන ගුණානුස්මරණ සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

පූර්විකාව.

''පිලිප් ගුණවර්ධන ගුණානුස්මරණ සංගමය'' යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන සංගමයක් එකී සංගමයේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව, එහි පරමාර්ථ ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ ඊට අදාළ කාරණා ඵලදායී ලෙස කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් පිහිටුවා තිබූ හෙයින් ද :

එකී සංගමය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කරුණු සඳහා ද, එම පරමාර්ථ සහ කරුණු මෙතෙක් කල් එකී සංගමය විසින් සාර්ථකව ක්‍රියාත්මක කර හා ඉටු කර ඇති හෙයින් ද, සහ එකී සංගමය සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති බැවින් ද, එකී ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත සඳහා වන හෙයින් ද ;

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2014 අංක 4 දරන පිලිප් ගුණවර්ධන ගුණානුස්මරණ සංගමය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

පිලිප් ගුණවර්ධන ගුණානුස්මරණ සංගමය සංස්ථාගත කිරීම.

**2.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසු (මෙහි මින් මතු ''සංගමය'' යනුවෙන් සඳහන් කරනු ලබන) දැනට පිලිප් ගුණවර්ධන ගුණානුස්මරණ සංගමයෙහි සාමාජිකයන් වශයෙන් සිටින තාක් තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු සාමාජිකයන් වශයෙන් බඳවා ගනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු ''සංස්ථාව'' යනුවෙන් සඳහන් කරනු ලබන) ''පිලිප් ගුණවර්ධන ගුණානුස්මරණ සංගමය'' යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු ය. තව ද, එකී නාමයෙන් ඒ සංස්ථාව විසින් ද, එයට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි ය. තවද, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද, පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය සහ අධිකාරය ඊට ඇත්තේ ය.

2- PL 006567 -2,850 (2014/02)

සංස්ථාවේ පොදු පරමාර්ථ.

**3.** සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) දිවංගත පිලිප් ගුණවර්ධන මැතිතුමාගේ දර්ශනය හා චින්තනය පිළිබඳ පර්යේෂණ පවත්වා ඒවා සංරක්ෂණය කර ප්‍රවර්ධනය කිරීම ;

(ආ) දිවංගත පිලිප් ගුණවර්ධන මැතිතුමාගේ දර්ශනය පිළිබඳ සිදු කරන ලද දේශන හා ලියන ලද ග්‍රන්ථ හා ලිපි ඇතුළුව ඒ සම්බන්ධව ලබා ගත හැකි ලිපි ලේඛන එකතු කොට සංරක්ෂණය කිරීම ;

(ඇ) දිවංගත පිලිප් ගුණවර්ධන මැතිතුමා සැමරීම පිණිස විවිධ ගුණානුස්මරණ උත්සව කටයුතු පැවැත්වීම;

(ඈ) මහා භාරකාර තැන යටතේ ස්ථාපනය කරන ලද පිලිප් ගුණවර්ධන පදනම් භාරය හා එක්ව කටයුතු කිරීම ;

(ඉ) දිවංගත පිලිප් ගුණවර්ධන මැතිතුමාගේ දර්ශනයට අනුකූලව යමින් විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ තරුණ ප්‍රජාව තුළ සිටින ඌන වරප්‍රසාදිත සහ නොසළකා හරින ලද කණ්ඩායම්වල සමාජ, අධ්‍යාපනික හා සංස්කෘතික සංවර්ධනය සිදු කිරීම ;

(ඊ) දිවංගත පිලිප් ගුණවර්ධන මැතිතුමා සිහිපත් කිරීම හා එතුමාගේ දර්ශණය පුළුල් ව ප්‍රචාරය කිරීමට ;

(i) අනාථ නිවාස හා වැඩිහිටි නිවාස වැනි ආයතන පිහිටුවීම හා පවත්වාගෙන යාම සඳහා අදාළ ආයතන වෙත සහාය ලබා දීම ;

(ii) රැකියා විරහිත තරුණ තරුණියන් අතර ස්වයං රැකියා ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව වෘත්තීය පුහුණු ආයතන ස්ථාපනය කිරීම සහ පවත්වාගෙන යාම සඳහා අදාළ ආයතන වෙත සහාය ලබා දීම සහ එවැනි තරුණ තරුණියන්ට මූල්‍යමය වශයෙන් සහ වෙළඳාම් කිරීමට සහ අනෙකුත් අවශ්‍ය සහාය ලබා දීම මගින් සාර්ථකව ව්‍යාපාර කටයුතුවලට සම්බන්ධවීමට සහාය වීම ;

(iii) පෙර පාසල් සහ දිවා සුරැකුම් මධ්‍යස්ථාන පිහිටුවීම සහ පවත්වාගෙන යාම සඳහා අදාළ ආයතන වෙත සහාය ලබා දීම සහ එවැනි දරුවන්ගේ සුභසාධනය සඳහා වැඩසටහන් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම ;

(iv) පුස්තකාල පිහිටුවීම සහ පවත්වාගෙන යාම සඳහා ආදළ ආයතන වෙත සහාය ලබා දීම සහ පුස්තකාල පරිහරණය කිරීමේ වැදගත්කම පිළිබඳ වැඩසටහන් ක්‍රියාවට නැංවීම ;

(v) අධ්‍යාපන ආයතන ස්ථාපිත කිරීම සහ පවත්වාගෙන යාම සඳහා අදාළ ආයතන වෙත සහාය ලබා දීම ;

(vi) සුදුසු ශිෂ්‍යයන් සඳහා ශිෂ්‍යත්ව සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීම ;

(vii) දිළිඳු පුද්ගලයන් හට ආහාර, ඇඳුම්, නිවාස සහ අනෙකුත් සහන ලබා දීම ;

**4.** ආණ්ඩුවේ හෝ පළාත් සභාවේ ඕනෑම අමාත්‍යාංශයක් හෝ දෙපාර්තමේන්තුවක් විසින් සමගාමීව පවත්වාගෙන යනු ලබන යම් කාර්යයක් සහ සංස්ථාවේ කාර්ය අතර කිසිදු ගැටුමක් නිර්මාණය නොවන ආකාරයෙන් සංස්ථාවේ අරමුණු ක්‍රියාත්මක කළ යුතු ය.

ආණ්ඩුවේ හෝ පළාත් සභාවේ අමාත්‍යාංශයක හෝ දෙපාර්තමේන්තුවක කාර්ය සමග සංස්ථාවේ කාර්ය ගැටුම් සහගත නොවන බවට සංස්ථාව සහතික විය යුතු බව.

**5.** (1) මේ පනතේ විධිවිධානවලට යටත්ව සංස්ථාවේ කටයුතු කළමනාකරණය සහ පරිපාලනය මේ පනතේ 7 වන වගන්තිය යටතේ සාදනු ලබන සංස්ථාවේ රීති මගින් නිශ්චය කරනු ලැබිය හැකි ධුර දරන්නන් යම් සංඛ්‍යාවකින් සමන්විත (මෙහි මින් මතු "කමිටුව" යනුවෙන් සඳහන් කරනු ලබන) කළමනාකරණ කමිටුවක් විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

(2) (අ) මෙම පනත ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී සංගමයේ කමිටුවේ ධුර දරන නිලධරයන්, 7 වන වගන්තිය යටතේ සාදනු ලබන රීති මඟින් දක්වා ඇති ආකාරයට සංස්ථාවේ පළමු කමිටුව පත් කරනු ලැබූ හෝ තෝරා පත් කරනු ලැබූ දින තෙක් සංස්ථාවේ කමිටුව ලෙසින් ක්‍රියාත්මක විය යුතු ය.

(ආ) මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ සිට වසරක් ඇතුළත සංස්ථාවේ පළමුවන කමිටුව පත් කළ හෝ තෝරා පත් කළ යුතු ය.

(3) (අ) අනුශාසකවරුන් හා උපදේශකවරුන් ද ඇතුළුව කමිටුවේ ධුර දරන සෑම නිලධරයකුම වර්ෂ තුනක කාලයක් සඳහා පත් කර ගත යුතු හෝ තෝරාපත් කර ගත යුතු අතර එම වර්ෂ තුනක කාලසීමාව ඉකුත් වීමෙන් පසුව එම ධුර දරන නිලධරයා, අනුශාසකවරයා හෝ උපදේශකවරයා නැවත පත්කර ගැනීම හෝ තෝරාපත් කර ගැනීම සඳහා සුදුස්සකු විය යුතු ය.

(ආ) යම් ධුර දරන නිලධරයකු මියයාම, ඉල්ලා අස්වීම, නොහැකියාවට පත්වීම හෝ ධුරයෙන් ඉවත් කිරීම නිසා පුරප්පාඩුවක් ඇතිවන අවස්ථාවක දී, කමිටුව විසින් සංස්ථාවේ රීති සැලකිල්ලට ගෙන එම පුරප්පාඩුව පිරවීම සඳහා යම් තැනැත්තකු තෝරා පත් කර ගත යුතු හෝ පත් කරගත යුතු ය.

(ඇ) (ආ) ඡේදය යටතේ තෝරාපත් කර ගනු ලබන හෝ පත්කර ගනු ලබන තැනැත්තා ඔහු අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය සඳහා ධුර දැරිය යුතු ය.

සංස්ථාවේ බලතල.

**6.** මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව සංස්ථාවේ පරමාර්ථ හෝ ඒ පරමාර්ථ අතුරින් යම් පරමාර්ථයක් ප්‍රවර්ධනය කිරීම හෝ නංවාලීම සඳහා පහත සඳහන් අවශ්‍ය හෝ අපේක්ෂිත සියලු ක්‍රියා හා කාරණා ක්‍රියාත්මක කිරීමේ, කිරීමේ හා ඉටු කිරීමේ බලය සංස්ථාවට ඇත්තේ ය —

(අ) සංස්ථාවේ කාර්ය සඳහා අවශ්‍ය වන්නා වූ, ඉඩම් හෝ ගොඩනැගිලි මිලට ගැනීමට, අත්කර ගැනීමට, කුලියට ගැනීමට, ඉදිකිරීමට, අළුත්වැඩියා කිරීමට හා අන්‍යාකාරයකින් ලබා ගැනීමට සහ සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව සුදුසු යැයි සැලකෙන අයුරින් ඒවා සම්බන්ධයෙන් ක්‍රියා කිරීම හෝ ඒවා බැහැර කිරීම;

(ආ) ඇප සහිතව හෝ රහිතව ණයට ගැනීම සහ මුදල් හෝ ද්‍රව්‍යවලින් ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග ලබා ගැනීම:

එසේ වුවද, සංස්ථාව වෙත ලබාදෙනු ලබන විදේශීය ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග සම්බන්ධයෙන් කමිටුව විසින් මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ පූර්ව ලිඛිත අනුමතිය ලබා ගත යුතු ය.

(ඇ) විනිමය බිල්පත්, චෙක්පත්, පොරොන්දු නෝට්ටු සහ වෙනත් ගනුදෙනු කළ හැකි සාධන පත්‍ර සකස් කිරීමට, ලිවීමට, භාර ගැනීමට, වට්ටම් දීමට, පිටසන් කිරීමට, ගනුදෙනු කිරීමට, මිලට ගැනීමට, විකිණීමට සහ නිකුත් කිරීමට සහ ඕනෑම බැංකුවක ගිණුම් විවෘත කිරීමට, ක්‍රියාත්මක කිරීමට, පවත්වාගෙන යාමට සහ වැසීමට ;

(ඈ) සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව ශ්‍රී ලංකාවේ හෝ විදේශීය යම් ආණ්ඩුවක දෙපාර්තමේන්තුවක්, පළාත් සභාවක්, හෝ රාජ්‍ය නොවන සංවිධානයක් හෝ වෙනත් යම් තැනැත්තෙක් හෝ ආයතනයක් සමග ගිවිසුම්වලට, හවුල් සබඳතාවලට හෝ ඒකාබද්ධතාවයන්ට ඇතුළත් වීමට ;

(ඉ) සංස්ථාවේ කාර්යයන් සඳහා වහාම අවශ්‍ය නොවන යම් අරමුදල් කමිටුව විසින් තීරණය කරනු ලබන ආකාරයකින් ආයෝජනය කිරීමට ;

(ඊ) සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව ඉඩකඩම් හෝ පෞද්ගලික දේපළකට බලපාන්නා වූ යම් නීතිමය භාරයක් හා කොන්දේසි භාර ගැනීමට, පිළිගැනීමට, ක්‍රියාත්මක කිරීමට, ඉටු කිරීමට සහ පාලනය කිරීමට ;

(උ) සංස්ථාවේ නිලධරයන් සහ සේවකයන් පත් කිරීම, සේවයෙහි නියුක්ත කිරීම, සේවයෙන් පහ කිරීම හෝ සේවය අවසන් කිරීම සහ ඔවුන් විෂයෙහි විනය පාලනය පවත්වාගෙන යාම සහ සංස්ථාව විසින් තීරණය කරන ලද වැටුප්, දීමනා සහ පාරිතෝෂික ගෙවීමට ;

(ඌ) සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව දේශන, සම්මන්ත්‍රණ සහ සමුළු සංවිධානය කිරීම;

(එ) සංස්ථාව සතු පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති දේශීය සහ විදේශීය අනෙකුත් ආයතන සමග සම්බන්ධතා පවත්වාගෙන යාම සහ සම්බන්ධීකරණය කිරීම ;

(ඒ) සංස්ථාවේ කාර්ය සඳහා ශ්‍රී ලංකාව තුළ හෝ විදේශයන්හි දී සේවක පිරිස් පුහුණු කිරීම ; සහ

(ඔ) සංස්ථාවේ පරමාර්ථ නිසි ලෙස සහ ඵලදායීව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය හෝ සුදුසු වෙනත් සියලු දේ කිරීම.

සංස්ථාවේ රීති.

**7.** (1) සංස්ථාව විසින් සංස්ථාවේ යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන්, මේ පනතට හෝ වෙනත් යම් ලිඛිත නීතියකට අනනුකූල නොවන රීති පහත දැක්වෙන සියලු කාරණා සඳහා හෝ ඉන් කිසිවක් සඳහා කලින් කල සෑදීම නීත්‍යානුකූල වන්නේ ය:—

(අ) සාමාජිකත්වය වර්ග කිරීම, සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඉවත් කිරීම, නෙරපීම හෝ ඉල්ලා අස්වීම සහ සාමාජිකයන් විසින් ගෙවිය යුතු ගාස්තු ;

(ආ) කමිටුවේ ධුර දරන්නන් තෝරාපත් කර ගැනීම, ධුරය හිස් කිරීම හෝ ධුරයෙන් ඉවත් කිරීම සහ ධුර දරන්නන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ;

(ඇ) සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, අනුයෝජිතයන්ගේ සහ සේවකයන්ගේ පත්කිරීම් නියම සහ කොන්දේසි, බලතල, කර්තව්‍ය හා කාර්ය ;

(ඈ) කමිටුවේ හෝ එහි යම් අනු කමිටුවක රැස්වීම් කැඳවීමේ දී හා පැවැත්වීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, රැස්වීම් පිළිබඳ නිවේදන හා න්‍යාය පත්‍ර, ගණපූරණ සහ ඒ රැස්වීම්වල කටයුතු කරගෙන යාම ;

(ඉ) සංස්ථාවේ සහ කමිටුවේ සාමාජිකයන් වීම සඳහා සුදුසුකම් සහ නුසුදුසුකම් ;

(ඊ) සංස්ථාවේ දේපල පරිපාලනය කිරීම හා කළමනාකරණය කිරීම ; සහ

(උ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන්පත් කර ගැනීම සහ සංස්ථාව විසුරුවා හැරීම.

(2) සංස්ථාව විසින් සාදන ලද යම් රීතියක් මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ සාදන ලද රීතියක් මෙන් එවැනිම රැස්වීමක දී එවැනිම ආකාරයෙන් සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සෑම කල්හිම මෙම වගන්තිය යටතේ සාදනු ලැබූ සංස්ථාවේ තත්කාලයේ බලපවත්වන රීතිවලට යටත් විය යුතු ය.

සාමාජික නාමලේඛනය.

**8.** (1) සාමාජිකයන්ගේ නම්, ලිපිනයන් සහ අනෙකුත් අත්‍යවශ්‍ය තොරතුරු ඇතුළත් කරන ලද සාමාජිකයන්ගේ නාම ලේඛනයක් කමිටුව විසින් පවත්වාගෙන යා යුතු ය.

(2) සංස්ථාවේ වාර්ෂික මහා සභා රැස්වීමට පෙරාතුව යම් සාමාජිකයෙක් ඔහුගේ සාමාජික මුදල් සහ අනෙකුත් අයවිය යුතු මුදල් ගෙවා ඇත්නම් මිස කිසිදු ධුරයක් වෙනුවෙන් ඔහුගේ ඡන්දය පුද්ගලිකව හෝ නියෝජිතයකු මගින් ක්‍රියාත්මක නොකළ යුතු අතර, ධුරයක් වෙනුවෙන් තෝරා පත්කර ගැනීම සඳහා ඉදිරිපත් නොවිය යුතු ය.

සංස්ථාවේ අරමුදල.

**9.** (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු ය.

(2) සංස්ථාව සඳහා සහ වෙනුවෙන් භාරගනු ලබන ත්‍යාග, රික්තවරණ, පරිත්‍යාග, සාමාජික මුදල්, දායක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන කමිටුව විසින් අනුමත කරනු ලබන බැංකු එකක හෝ වැඩි ගණනක සංස්ථාවේ ගිණුමේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(3) මේ පනත යටතේ ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, හා ඉටු කිරීමේ දී සංස්ථාව විසින් දරනු ලබන වියදම් පියවීමට අවශ්‍ය වන සියලු මුදල් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

ගිණුම් හා විගණනය.

**10.** (1) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) සංස්ථාව විසින් එහි ආදායම සහ වියදම, වත්කම් සහ බැරකම් සහ සංස්ථාවේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබාගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) සංස්ථාවේ ගිණුම් විගණකාධිපතිවරයා විසින් හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාව ප්‍රකාර විගණකාධිපතිවරයා විසින් පත් කරනු ලබන සුදුසුකම්ලත් විගණකවරයකු විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ කාර්ය සඳහා "සුදුසුකම්ලත් විගණකවරයා" යන්නෙන් —

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීම සඳහා ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නාවූ ද තැනැත්තෙක් ; හෝ

(ආ) යම් ගණකාධිකාරී සමාගමක, එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියේ යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද, සාමාජිකයන්ගෙන් යුත් එවැනි ගණකාධිකාරී සමාගමක්,

අදහස් වේ.

සංගමය විසින් ගෙවිය යුතු සහ සංගමයට අයවිය යුතු ණය මුදල්.

**11.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී සංගමය විසින් ගෙවිය යුතු සියලු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවනු ලැබිය යුතු අතර, එදිනට සංගමයට අයවිය යුතු සියලු ණය සහ සංගමයට ගෙවිය යුතු සාමාජික මුදල් සහ දායක මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාව වෙත ගෙවනු ලැබිය යුතු ය.

**12.** යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නියාදනයක් හෝ වෙනත් යම් ආකාරයකින් සංස්ථාව සතුවන චංචල හෝ නිශ්චල යම් දේපලක් අත්කර ගැනීමට සහ දැරීමට මේ පනතේ විධිවිධානවලට යටත් ව නීතියෙන් සංස්ථාවට හැකියාව සහ බලය ඇති අතර, ඒ දේපල විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ වෙනත් ආකාරයකින් නියාදනය කිරීමේ පූර්ණ බලය ඇතිව 7 වන වගන්තිය යටතේ සාදන ලද සංස්ථාවේ රීතිවලට යටත්ව මේ පනතේ කාර්යය සඳහා සංස්ථාව විසින් ඒ සියලු දේපල දැරිය යුතු ය.

සංස්ථාව විසින් චංචල හා නිශ්චල දේපල දැරිය හැකි බව.

**13.** කවර ආකාරයකින් හෝ ලබාගන්නා සංස්ථාවේ මුදල් හා දේපල සංස්ථාවේ පරමාර්ථ ඉටු කර ගැනීම කෙරෙහි පමණක් අදාළ කරගත යුතු අතර, එයින් කිසිදු කොටසක් සංස්ථාවේ සාමාජිකයන්ට ලාභාංශ මුදල්, ප්‍රසාද දීමනා හෝ ලාභ වශයෙන් ඍජුව හෝ අන්‍යාකාරයෙන් නොගෙවිය යුතු හෝ නොපැවරිය යුතු ය.

මුදල් සහ දේපල අදාළ කර ගැනීම.

**14.** (1) සංස්ථාවේ කමිටුවේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී මිස සංස්ථාවේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු අතර, ඔවුන් දෙදෙනා තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු ය. ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමකට පරිබාහිරව විය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

(2) සංස්ථාවේ මුද්‍රාව, කමිටුව විසින් තීරණය කරනු ලැබිය හැකි කමිටුවේ යම් ධුර දරන නිලධරයකු භාරයේ තිබිය යුතු ය.

**15.** (1) සංස්ථාව විසුරුවා හැරීමේ දී එහි සියලු ණය සහ බැරකම් පියවීමෙන් පසු යම් දේපලක් ඉතිරි වී තිබුණහොත් ඒ දේපල සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපලක් ස්වකීය සාමාජිකයන් අතර බෙදීම තහනම් කරනු ලබන්නා වූ ද වෙනත් යම් ආයතනයකට ඒ දේපල දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය.

විසුරුවා හැරීමේ දී ඉතිරිවන දේපල.

(2) (1) වන උපවගන්තියේ කාර්ය සඳහා උචිත ආයතනය සංස්ථාව විසුරුවා හැරීමට පෙරාතුවම සංස්ථාවේ සාමාජිකයන් විසින් සංස්ථාවේ යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු ය.

ජනරජයේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**16.** ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

**17.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.